රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/96(1)

කොළඹ -07, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය
1996 ජූනි මස 21 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>සරප් සේවයේ නව ව්‍යුහය ක්‍රියාත්මක කිරීම.</u>**

1996.01.11 දින අංක 1/96 හා 1975.11.10 දින අංක 10 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. 1975.04.01 දින සිට ප්‍රතිව්‍යුහගත සරප් සේවයේ පත් කිරීම්, වැටුප් වර්ධක ප්‍රතිලාභ පමණක් අත්වන පරිදි 1996.01.11 දින අංක 1/96 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර 1971.10.01 දිනට පෙරදාතම් කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ඉල්ලීම්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් මෙහි පසුපිට ඇති ආකෘති පත්‍රයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. දැනට රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන ඇති නිලධාරීන්ගේ සහ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගිනි.

**03.** අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එකී නිලධාරීන් සිය ඉල්ලුම්පත්‍රවල සඳහන් කර ඇති තොරතුරු එකී නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුවල මුල් ලිපිලේඛන සමග පරීක්ෂා කර බලා, ආකෘති පත්‍රයේ II කොටසේ දැක්වෙන සහතිකය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති විටකදී හෝ එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කර ඇති විටකදී ඔහු/ඇය සම්බන්ධයෙන් රහස්‍ය වාර්තාවක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ අවධානයට ලක් කරන ලෙස සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ
................................................ මගින්,

**1975.04.01 දින සිට ප්‍රතිව්‍යූහගත සරප් සේවයට කරන ලද පත් කිරීම් වැටුප් වර්ධක ප්‍රතිලාභ පමණක් අත්වන පරිදි 1971.10.01 දිනට පෙරදතම් කරන ලෙස ඉල්ලීම්.**

**(1) වන කොටස - (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා )**

01. නම :-
    1:1 නිලධාරියාගේ සම්පූර්ණ නම (මුලකුරු සමඟ ) :-
    1:2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :-

02. උපන් දිනය හා 1971.10.01 දිනට වයස :-
03. සේවා ස්ථානය :-
    3:1 දැනට සේවය කරන ස්ථානය :-
    3:2 1975.04.01 දිනට සේවය කල ස්ථානය :-
    3:3 1971.10.01 දින සේවය කල ස්ථානය :-
    (අමාත්‍යාංශ , දෙපාර්තමේන්තුව සමඟ ශාඛා කාර්යාලයේ නම ද සඳහන් කරන්න)
04. පත්වීම් හා උසස් කිරීම් පිළිබඳ විස්තර :-
    4:1 III ශ්‍රේණියට පත් වූ දිනය
    (1975 සරප් සේවය ප්‍රතිස්ථාපනයට පෙර) :-
    4:2 සේවයේ ස්ථිර කල දිනය :-
    4:3 II "ආ'' බණ්ඩයට අන්තර්ග්‍රහණය කල දිනය :-
    4:4 II "අ'' බණ්ඩයට අන්තර්ග්‍රහණය කල දිනය :-
    4:5 I පන්තියට අන්තර්ග්‍රහණය කල දිනය :-
    4:6 දැනට දරන තනතුරු, පංතිය හෝ බණ්ඩය :-
    4:7 දැනට දරන තනතුර, පංතියට / බණ්ඩයට පත් වූ දිනය :-
    4:8 පළාත් රාජ්‍ය සේවයට මුදා හැර ඇත්නම්, එසේ මුදාහල දිනය :-
    4:9 විශ්‍රාම ගොස් ඇත්නම් , විශ්‍රාම ගිය දිනය :-

05. 1971.10.01 දින සිට ලබා ගෙන ඇති අඩ වැටුප් සහිත / වැටුප් රහිත නිවාඩු විස්තර

| <u>වර්ෂය</u> | <u>මාසය</u> | <u>අඩ වැටුප්</u> | <u>වැටුප් රහිත</u> |
|---|---|---|---|

06. 1971.10.01 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ විනය කටයුත්තකට ලක්ව සිටියේ නම්, ඒ පිළිබඳ විස්තර :-

    6:1 වැඩ තහනමට ලක්ව සිටි කාලය :-
    6:2 නැවත සේවයේ පිහිටවූ දිනය :-
    6:3 පනවනු ලැබූ දඬුවම් :-

07. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබූ දිනයත්, හා / හෝ එකී පරීක්ෂණයන්ගෙන් සාමාර්ථ ලැබීම් අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලද දිනයත් :-

08. මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට මා විසින් ඉහත කර ඇති ප්‍රකාශය නිරවද්‍ය හා සත්‍ය බැව් මෙයින් සහතික කරමි. මා විසින් කර ඇති ප්‍රකාශය හෝ ඉන් කොටසක් හෝ සාවද්‍ය හෝ අසත්‍ය හෝ බැව් පසුව එළිදරව් වුවහොත් මා වෙත නිකුත් කරනු ලැබිය හැකි අන්තර්ග්‍රහණය කිරීමේ / උසස් කිරීමේ ලිපිය අවලංගු කරනු ලැබිය හැකි බවද, මට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉඩ ඇති බවද, මම හොඳකාර තේරුම් ගතිමි.

අයදුම්කරුගේ අත්සන

**<u>II කොටස</u>**

09. අමාත්‍යාංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

9.1 ..............................................................මහතා / මහත්මිය/ මෙනනෙවිය විසින් ඉහත / පසුපිට දක්වා ඇති ප්‍රකාශය ඔහුගේ /ඇයගේ පුද්ගලික ලිපිගොනුවේ ඇති මුල් ලිපිලේඛන සමග පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,..................................... කොටුවල සඳහන් තොරතුරු නිවැරදි කල බවත්,

9.2 ඔහුගේ /ඇයගේ වැඩ , හැසිරීම හා පැමිණීම සතුටුදායක බවත්,

9.3 ඔහු / ඇය 1971.10.01 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ යෙදුනු වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති බවත්, වැටුප් වර්ධකට අනතුරුව දඬයකට හෝ තරවටු කිරීමකට හෝ වඩා වැඩි දඬුවමකට යටත් වී නොමැති බවත්,

9.4 1996.01.11 දින අංක : 1/96 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට යටත්ව වැටුප් වර්ධක ප්‍රතිලාභ පමණක් අයත්වන පරිදි 1975.04.01 දිනට ප්‍රතිව්‍යුහගත සරප් සේවයේ ........................ පන්තිය, බණ්ඩයට අන්තර්ග්‍රහණය කිරීම 1971.10.01 දිනට පෙරදතම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් ලබා ඇති බවත්, මම මෙයින් සහතික කරමි.

9.5 නිලධාරියාට එරෙහිව පැවැත්වෙන විනය පරීක්ෂණය පැවැත්වීමට අදහස් කර විනය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් රහස්‍ය වාර්තාවක් මේ සමඟ එවා ඇත.

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා

දිනය :-

(මෙම සහතිකය අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පරිපාලන කටයුතු භාර නියෝජ්‍ය ප්‍රධානියා විසින් හෝ පුද්ගලිකවම අත්සන් කළ යුතුය.)